10 වන පිටෙන්

කිසිකෙනෙකුට පත්වීම් ලිපි දීලා නෑ. බොහොමයක් ආයතන තියෙනවා උදේ පත්වීම දෙනවා හවසට එලවනවා. අපේ ළඟ කිසිම සේවකයෙක් අස් කරල නෑ. පසුගිය කාලකන්නි යහපාලන ආණ්ඩුව මේ බොරු ප්‍රශ්න ඇති කළ නිසා හයදාහක් විතර අපේ කොල්ලන්ට රැකියාව නැතිවෙලා ගියේ. පසුගියදා සී අයි ඩී එකෙන් මගෙන් ඇහුවා කෝ මේ වැඩකරන අයගේ පුද්ගලික ලිපිගොනු කියලා. මම කිව්වා එහෙම ඒව නෑ. එතකොට එයාල ඇහුවා එහෙම කොහොමද මිනිස්සුන්ට රැකියාවක් දෙන්නේ කියලා. මම කිව්වා ඒ අයට සියයට සීයක් මාව විශ්වාසයි මට සියයට සීයක් එයාල විශ්වාසයි, ඊටත් වඩා සහතිකයක් කොහෙද තියෙන්නෙ කියලා.

**සන්නස:** ඔබේ සේවකයන්ට ආයුධ එහෙමත් දෙනවා. එහෙම එකේ ඒ අයගේ විස්තර පොලිස් සහතික නැතුව මේ වගේ බැරෑරුම් වැඩක් කරන්න පුලුවන්ද?

**සේනාධිපති මහතා:** විශ්වාසය තමයි හොඳම සහතිකය. අපේ ළඟ වැඩ කරන කට්ටිය ගැන සියයට සියයක් අපිට සහතික වෙන්න පුළුවන් නම් ඔය කඩදාසි වල තියෙන වෙන අය ලියල දීපු සහතිකවලින් මට ඇති පලක් නෑ. මම කෙනෙක් රැකියාවට බඳවා ගන්නේ ඔහුට ඇති රැකියාවක අවශ්‍යතාවය මත ම පමණයි. මට පී එච්ඩී උපාධිය ලබාගත් කෙනෙක් ආවත් ආමි කෝප්‍රල් කෙනෙක් ආවත් එකයි. මම පීඑච් ඩී උපාධිය ලද කෙනෙක් දකින්නේ ඔහුට තේරුම් ගැනීමට ඇති හැකියාව ඉහළය යන සංකල්පය මතම පමණයි. ලංගමයට අමාත්‍යවරයෙක් විදියට දත් දොස්තර කෙනෙක් දැම්මම හිතා ගන්න පුළුවන්නේ ප්‍රතිපලය. අපේ ගාව ඒ වගේ ක්‍රම නෑ. රැකියාව කරන්න තියෙන උවමනාවයි ඒක හැකියාවයි තමයි මං බලන්නේ. අනිත් එක පැය අටේ ඩියුටි මගේ ළඟ නෑ. රෑ දෙකට කතා කළත් ඒගොල්ලො වැඩ කරන්න සූදානමින් ඉන්න ඕනේ. අනික කිසිකෙනෙක් ෆෝන් එක ඕෆ් කරගෙන තියාගෙන ඉන්න බෑ. හැබැයි කාට හරි අසනීපයක් වෙලා අවුරුදු දෙකක් ගෙදර ඉන්න වුනොත් මම ඒ අවුරුදු දෙකම පඩිය ගෙවනවා.

**සන්නස:** ඔබ ලංකාවට අවුරුද්දකට රුපියල් බිලියන 20 ක විතර විදේශ විනිමයක් ගෙනාපු කෙනෙක්. වෙන රටක නම් ඔබ පුදන්නේ සම්මානවලින් කුසලාන වලින්. නමුත් අපේ රටේ ඔබ පිදුවෙ ජම්පර් එකෙන් බෙලෙක් තැටියෙන්. ඉතින් රට ගැන ආඩම්බරයි ද?

**සේනාධිපති මහතා:** මම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රජයෙන් මේක වෙනස් කරනවා. අපිට ඉන්නවා කාලකන්නි ඇමතිවරු කියලා කට්ටියක්. රටට මොන ආදායම ගෙනාවත් ඒගොල්ලොන්ට යමක් ලැබෙන්නෙ නැත්තං ඒගොල්ලො ඒ වැඩේ කරන්න අරින්නෙ නෑ. ඒ විතරක් නෙමේ කරන මිනිහට පුළුවන් තරම් කරදර කරනවා. අනිත් එක ඒගොල්ලො හිතුව මම නැතුව ඒගොල්ලන්ට මේක කරන්න පුළුවන් කියලා. අඩුගානේ මං කලාට වැඩිය හොඳට නැත්තං ඒ ගානට වත් කරගෙන ගියා නම් ඇත්තටම මම සතුටු වෙනවා. දැන් මේගොල්ලෝ ලබාගන්නේ අපි කරපු ප්‍රමාණයෙන් සීයට විස්සයි. මේකට රජය වගේම නාවික හමුදාවත් වගකියන්න ඕන. නාවික හමුදාවේ හිටපු අද්මිරාල් රවීන්ද්‍ර විජේගුණරත්න කියන නිලධාරියාට කප්පන් නොගෙවීම නිසා ඔහු තමයි මේ ව්‍යාපාරය විනාශ කරන්න විශාල වශයෙන් දායක වුණේ.ඇවන්ගාඩ් කියන අපේ ව්‍යාපාරය තමයි ලෝකයේ මුහුද මැද ආරක්ෂාව සපයන්නට සිටින ප්‍රමුඛ ආයතනය. එංගලන්තයෙ ලොයිඩ්ස් සහතිකය අපට තියෙනවා. ඒක සල්ලි වලට ගන්න පුළුවන් එකක් නොවෙයි. ලෝකයේ රටවල් 5කින් අපට සම්මාන හම්බ වුනා ,අප අවි ආයුධ සහිතව කරන සේවාව සම්බන්ධයෙන් අපේ නැව් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ පවා නීතිගත කරලා ගැසට් කරල තියෙන්නෙ.ඇවන්ගාර්ඩ් මැරිටයිම් අනුමතයි කියල බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙන් නිකුත් කල ගැසට් එකක තියෙන්නෙ අපේ ආයතනය විතරමයි.රටවල් 52ක් අපේ සේවාව පිලි අරගෙන තියෙනවා.හැබැයි අපේ රටේ දේශපාලකයින්ට කප්පම් නොගෙවූ නිසා ඔවුන් මෙය විනාශ කළා.ඊට අමතරව් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා හිරගත කරන්නට මේ හරහා මඟක් පාදා ගන්නට ඔවුන් උත්සාහ කළා.

**සන්නස:** අපි දුටුවා ඔබ අත තුවාල වෙලා සිංගප්පූරුවේ රෝහලක ප්‍රතිකාර ගනිමින් ඉදිද්දි කරන ලද වීඩියෝ එකක්. එකේදි ඔබ මහත්සේ හැඟුම්බර වෙනවා. දෙනෙතට කඳුළු එනවා. මේ තරම් විපර්යාසයක් කරන්න පුළුවන් වෙච්ච ඔබ, බරපතළ අභියෝගවලට යුද බිමේ දී මුහුණ දුන් ඔබ ඇයි මෙතෙන්දි මෙතරම් හැඟීම්බර වෙන්නේ. රටට විශාල විදේශ විනිමයක් නොලැබී යාම සම්බන්ධයෙන් ඇත්තවශයෙන්ම රට වැසියෝ හැටියට අපියි හැඬිය යුත්තේ.

**සේනාධිපති මහතා:** මම කොමාන්ඩෝ කෙනෙක් හැටියට පුහුණු කරලා තියෙන්නේ ලෝකේ ඉන්න දරුණුම ත්‍රස්තවාදය විනාශ කරන්න. එහෙනම් මම දරුණු ත්‍රස්තවාදයට වැඩිය දරුණු විය යුතුයි නේද? මෙතෙන්දි අපිව පුරුදු කරනවා ත්‍රස්තවාදියා ඝාතනය කරන්න ඒ වගේම අවශ්‍ය තැනදී හැඟුම්බර වෙන්න. මොකද කොමාන්ඩෝ නිලධාරියෙක් හැටියට අපි යුද භූමියට ගියාම තීරණ ගන්න ඕන අපිමයි. අපිට අණ දෙන්න කවුරුවත් නෑ. අන්න ඒ නිසයි අවශ්‍ය තැනදි අපි හැඟුම් බර විය යුත්තේ. ඒක ඉංග්‍රීසියෙන් කියනවා මෙන්න මෙහෙම I was trained to cry before I was trained to kill .ඒ කියන්නේ කොමාන්ඩෝ භටයා සාමාන්‍ය මිනිසෙකුටත් වඩා හැඟීම් බර මිනිහෙක්.දරුණුම ත්‍රස්තවාදියෙක් මරන්න මම කැලයේ සැඟවිලා ස්නයිපර් අවිය සූදානම් කරගෙන පැය හත අටක් තිස්සේ බලන් ඉන්නකොට එම ත්‍රස්තවාදියා තමන්ගේ කුඩා දරුවත් වඩාගෙන එනවා මම දුටුවොත් ඉතා පහසුවෙන් එල්ලය ගත හැකි වුනත් මම වෙඩි තියන්නේ නැහැ. මම ෂීෂී කාරය වගේ තුවක්කුවේ කොකා ගස්සන්න විතරක් ඉන්න කෙනෙක් නෙවෙයි.

අර වීඩියෝ පටයේ මම හැඟුම්බර වුනේ මගේ ව්‍යාපාර නැති වුණාට නෙමෙයි. මගේ පවුලේ අයට හිරිහැර කරනවා මම කැමති නෑ. මොකද ඒගොල්ලෝ මේ කිසිදේකට සම්බන්ධ නෑනෙ. ඇයි ඒ ගොල්ලන්ට හිරිහැර කරන්නේ. ඇත්තටම ඒගොල්ලන්ට හිරිහැරයක් කරනකොට මම සංවේදී වෙනවා.

ලංකාවේ මිනිස්සු සමහරක් පහර ගැහුවා ගෝඨාභය යුද්ධෙදි පැනල ගියා කියල .මම ඒ අයට කියන්න කැමතියි කට්ටපරිච්චාන් කියන මෙහෙයුමේ හිටියේ කමාන්ඩෝ භටයෝ 200 නිලධාරි 17 යි.ඒකෙදි මැරුණා නිලධාරීන් 6 දෙනෙකුයි සෙසු නිල 60 දෙනෙකුයි. 80 කට වැඩිය තුවාල වුනා. මුළු රෙජිමේන්තුවම විනාස වුණා. මුළු ලෝකෙම

42 වන පිටට

